අ.පො.ස. උසස් පෙළ

# ජෛවපද්ධති තාක්ෂණවේදය ii

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය

විභාග අංකයඃ ........................................

සැලකිය යුතුයි.

* **A කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
* **B කොටසෙන් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## A කොටස - ව්‍යුහගත රචනා

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න. (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 75 කි. )**

**01. (A)** කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ සමහර තීරණ කාලගුණික පුරෝකථන මත පදනම් වේ.

i). කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කාලගුණික පුරෝකථනයේ ප්‍රධාන වැදගත්කම කුමක් ද?

..........................................................................................................

.................................................................................................... (ල. 04)

ii). ගොවීන් වගා කටයුතු සිදු කිරීමේ දී කාලගුණ වෙනස්වීම් කලින් හඳුනා ගැනීමට යොදා ගන්නා ප්‍රධාන මෙවලමක් සඳහන් කරන්න.

.................................................................... (ල.04 )

iii ). පොකුණු තුළ ඉස්සන් වගාවට වර්ෂාපතනය ඇති කරන ප්‍රධාන අහිතකර බලපෑමක් සඳහන් කරන්න.

........................................................................................ (ල. 03)

**(B)** ස්වයංක්‍රීය කාලගුණික මධ්‍යස්ථානයක ප්‍රධාන අංගයකි, පුනරාරෝපණය කළ හැකි කෝෂ.

i). පුනරාරෝපණ කෝෂවල ප්‍රධාන අවශ්‍යතාව සඳහන් කරන්න.

........................................................................................ (ල. 04)

ii). කෝෂ පුනරාරෝපණය සඳහා යොදාගත හැකි ප්‍රධාන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1) ....................................................................................

2) ....................................................................................... (ල. 3× 2)

**(C)** පසක රසායනික ලක්‍ෂණ වෙනස් වීම පසෙහි භෞතික හා ජෛවීය ලක්‍ෂණ වෙනස් වීමට ද හේතු වේ.

i). අධික ලෙස රසායනික පොහොර භාවිතය නිසා පසේ පිරිහී යන රසායනික ලක්‍ෂණයක් සඳහන් කරන්න. ……………………………………… (ල. 04)

ii). කඳුකර බිමක ඇති තේ වගාවක් සඳහා තේ කප්පාදුවෙන් පසුව ගොවියෙකු පොහොර ලෙස ඩොලමයිට් යෙදීමට ප්‍රධාන හේතුව කුමක් විය හැකි ද ?

………………………………………………………………………………… (ල. 04)

**(D)** යාබද සමෝච්ච රේඛා දෙකක් අතර තිරස් දුර සමතුල්‍යයයි. මෙම තිරස් දුර මඟින් භූ විෂමතාව පිළිබඳව අදහසක් ගත හැකි ය.




රූපයේ සඳහන් සමෝච්ච රේඛා සටහන අනුව i), ii), iii) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i). (a) මෙමගින් නිරූපණය වන භූ ලක්ෂණය කුමක් ද ?

……………………………………………………… (ල. 03)

(b). එහි D) i (a) හි සඳහන් භූ ලක්‍ෂණය හඳුනා ගැනීමට භාවිත කළ හැකි දර්ශකයක් සඳහන් කරන්න. ……………………………………….. (ල. 04)

ii). මෙහි තිරස් දුර සමතුල්‍ය පිළිබඳ ඔබේ අදහස කුමක් ද ?

……………………………………………………………………………… (ල. 04)

**(E)** බිම් දුර මැනීමේ දී රේඛීය මිනුම් හා කෝණික මිනුම් මනිනු ලබයි.

i). රේඛීය මිනුමක් වන තිරස් දුර මැනීමට මිනුම් රෝදය භාවිතයේ ප්‍රධාන වාසිය සඳහන් කරන්න. ……………………………………………………………………………… (ල. 03)

ii). කෝණික මිනුම් ලබා ගැනීමට වර්තමානයේ භාවිත වන සුලබ ම උපකරණය කුමක් ද ?

……………………………………………………………………………… (ල. 02)

**(F)** ජල දූෂණය වර්තමානයේ ප්‍රධාන පාරිසරික ගැටලුවක් බවට පත්ව ඇත.

i). ශ්‍රී ලංකාවේ ජල දූෂණයට හේතුවන ප්‍රධාන ප්‍රභව දෙක නම් කරන්න.

1. ……………………………………………………

2. …………………………………………………… (ල. 3× 2)

ii). කර්මාන්තවලින් උණු ජලය, ජල ප්‍රභවවලට බැහැර කිරීමට ප්‍රධාන හේතුව කුමක් ද ?

……………………………………………………………………………….. (ල. 04)

iii). බ්‍රොයිලර් මස් නිෂ්පාදනයක අපජලය පිරිපහදු කර ජල ප්‍රභවවලට මුදා හැරීම සඳහා අවසර ලබා ගත යුතු ආයතනය කුමක් ද ?

……………………………………………………………………………….. (ල. 04)

iv). ජලයේ උෂ්ණත්වය වැඩි වීමෙන් ජලයේ වෙනස් වන රසායනික හා ජෛවීය ලක්ෂණය බැගින් සඳහන් කරන්න.

රසායනික - ……………………………………………………… (ල. 04)

ජෛවීය - ………………………………………………………… (ල. 04)

**G)** තවාන් කරුවෙකුට ලැබුණු ඇණවුමක් අනුව බද්ධ පැළ තොගයක් ප්‍රවාහනයට කලින් සූදානම් කරන ලදී. එහි දී බඳුන් පිරිසිදු කර, වල් පැළ ගලවා හිස් අවකාශ පුරවා හොඳින් ජලය යෙදී ය. ඉහත ක්‍රියා අතරින්,

i). a). මොහු විසින් සිදු කළ නොකළ යුතු ක්‍රියාව කුමක් ද ?

…………………………………………………………………………….. (ල. 04)

b). එම ක්‍රියාව නොකළ යුතු වීමට හේතුව සඳහන් කරන්න.

……………………………………………………………………………. (ල.04)

iii). වාණිජ තවාන්වල බඳුන් තවාන් ජනප්‍රිය වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

1) ……………………………………………………………………………

2) …………………………………………………………………………… (ල. 02 × 2)

**02.** (A) ආරක්ෂිත ව්‍යුහ ඉදිකිරීම් දැනුම ඇති පුද්ගලයෙකු පහතරට තෙත් කලාපයේ පොලිතින් ගෘහයක තක්කාලි වගාවක් ආරම්භ කිරීමට අදහස් කරයි.

i). මෙම ගෘහය තුළ උෂ්ණත්වය පාලනය කිරීමට ඔහුට සිදු කළ හැකි ව්‍යුහාත්මක වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

1) ……………………………………………………………………………

2) ……………………………………………………………………………. (ල. 02 × 2)

ii). තක්කාලි වගාව සඳහා ඔහුට අවශ්‍ය කෘෂිකාර්මික දැනුම ලබාගත හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1) ……………………………………………………………………………

2) ……………………………………………………………………………. (ල. 02 × 2)

iii). මෙම ගෘහය තුළ වගා කටයුතුවල නියැළීමට ඔහුට ඇති කාලය හා ශ්‍රමය සීමිත නම් මේ සඳහා ඔබ යෝජනා කරන විසඳුමක් සඳහන් කරන්න.

…………………………………………………………………………… (ල. 04)

**(B)** බෝගයක අස්වනු නෙළීමට සුදුසු බව තීරණය කරන සාධකයක් ලෙස පරිණත දර්ශනය භාවිත කෙරේ. පහත දී ඇති වර්ධන කාල වක්‍රයට අනුව (i), (ii) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i). පහත සඳහන් බෝගයන් හී අස්වනු නෙළීමට සුදුසු අවස්ථාව අදාළ අක්ෂරය තෝරා හිස්තැනෙහි දක්වන්න.

| **බෝගය** | **අවස්ථාව** |
|---|---|
| 1) වැටකොළු | ........................... |
| 2) අලිගැටපේර | ........................... |
| 3) අන්නාසි | ........................... (ල. 03 × 3) |

ii). D අවස්ථාවේ අස්වනු නෙළීමෙන් ඇතිවිය හැකි බලපෑමක් සඳහන් කරන්න.

……………………………………………………………………… (ල. 04)

**(C)** ට්‍රැක්ටරයේ ද්‍රාව පාලන පද්ධතියක ප්‍රධාන අවශ්‍යතාව වනුයේ කෘෂි යන්ත්‍ර උපකරණ ක්‍රියාත්මක කරවා ගැනීමයි.

i). ද්විරෝද හා සිව්රෝද ට්‍රැක්ටරවලට විවිධ කෘෂි උපකරණ සවි කිරීමට භාවිත කරන බල ප්‍රතිදාන දෙකක් නම් කරන්න.

1) ………………………………………………………………

2) ……………………………………………………………… (ල. 04)

ii). ද්විරෝද හා සිව්රෝද ට්‍රැක්ටර දෙකෙහි ම සම්බන්ධ කළ හැකි කෘෂි උපකරණ දෙකක් නම් කරන්න.

1) ………………………………………………………………

2) ……………………………………………………………… (ල. 02 × 2)

**(D)** පහත දැක්වෙන්නේ බිංදු ජල සම්පාදන පද්ධතියක රූපසටහනකි. ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු දීමට මෙම රූප සටහන භාවිතා කරන්න.




i). ඉහත රූපසටහනේ E භාවිතයේ අරමුණ කුමක් ද ?

........................................................................................ (ල. 04)

ii). මෙහි C ස්ථානයේ සිදුරු විදීමේ දී වරදක් සිදු වී ඇති අතර මෙම සිදුරු වැසීම සඳහා කුමක් සිදු කළ හැකි ද ? ........................................................................ (ල. 04)

iii). මෙම පද්ධතිය සඳහා A භාවිත කිරීමේ අවශ්‍යතාව කුමක් ද ?

........................................................................................ (ල. 04)

iv). D නම් කරන්න. එය භාවිතයේ අරමුණ කුමක් ද ?

D - ........................................................................................ (ල. 03)

භාවිතයේ අරමුණ - ........................................................................ (ල. 03)

**(E)** විවිධ ශාකවල ශාක සාර ලබා ගන්නා ස්ථානය හා ශාක සාර ලබා ගැනීමේ ක්‍රමය එකිනෙකට වෙනස් වේ. පහත සඳහන් ශාක කොටස්වලින් ශාක සාර ලබා ගන්නා ප්‍රධාන ක්‍රමවේදය සඳහන් කරන්න.

| **ශාක කොටස** | ක්‍රමවේදය | |
|---|---|---|
| 1) කොහොඹ ඇට | ................................................................ | (ල. 02) |
| 2) උක්දඬු | ................................................................ | (ල. 02) |
| 3) ලෙමන් ග්‍රාස් පත්‍ර | ................................................................ | (ල. 02) |
| 4) බෙලි මල් | ................................................................ | (ල. 02) |

**03.** (A) වැවිලි බෝග ආශ්‍රිත විවිධ භාණ්ඩ නිෂ්පාදනය කෙරේ.

i). ගිලුම් අච්චු භාවිතයෙන් රබර් භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලයේ පහත ගැලීම් සටහනේ හිස්තැන් පුරවන්න.

**කේන්ද්‍රාපාසරිත ක්ෂීරය**

↓

(1) ………………….. ( ල. 02)

↓

**පළමු ගිල්වීම**

↓

(2) ………………….. ( ල. 02)

↓

(3) ………………….. ( ල. 02)

↓

**වල්කනයිස් කිරීම**

↓

(4) ………………….. ( ල. 02)

ii). පොල් ගෙඩියෙන් ඉවත් කරන පොල් ලෙලි යොදා ගනිමින් සිදු කරන ප්‍රධාන වාණිජ නිෂ්පාදන කර්මාන්ත දෙකක් සඳහන් කරන්න.

1. ……………………………………………………… (ල. 03)
2. ……………………………………………………… (ල. 03)

**(B)** කෘෂි කර්මාන්තයේ දී ස්වයංක්‍රියකරණ සඳහා පාලන පද්ධති භාවිතා කෙර්.




i). ඉහත රූපසටහනේ A හි කාර්යයන් සඳහා භාවිත කළ හැකි උපාංගයක් සඳහන් කරන්න.
……………………………………………………………………… (ල. 04)

ii). C හි අදාළ ප්‍රතිදාන ලබා ගැනීමට භාවිතා කළ හැකි උපාංග තුනක් සඳහන් කරන්න.

1) ……………………………………………… (ල. 03)

2) ……………………………………………… (ල. 03)

3) ……………………………………………… (ල. 03)

iii). ක්ෂුද්‍ර පාලන පද්ධතියකට උදාහරණයක් ලෙස ආර්ඩියුනෝ දැක්විය හැක.

පහත දක්වා ඇති ආර්ඩිනෝ පුවරුවේ A, B, C, D නම් කර ඒවායේ කාර්යය සඳහන් කරන්න.




| කොටස | කාර්යය |
| --- | --- |
| A - .................................. | ............................................................ |
| B - .................................. | ............................................................<br>............................................................ |
| C - .................................. | ............................................................<br>............................................................ |
| D - .................................. | ............................................................ |
| (ල. 02 × 4) | (ල. 04 × 4) |

(iv). ස්වයංක්‍රියව නිවෙන හා දැල්වෙන ආලෝක විමෝචක ඩයෝඩයක් නිර්මාණ කිරීමට ශිෂ්‍යයෙකු ඒ සඳහා එහි ආර්ඩිනෝ පුවරුවේ අංක 06 ට වයර් සම්බන්ධ වන ලෙස පරිපථය සම්බන්ධ කරන ආකාරය ඇඳ පෙන්වන්න. (ල. 06)



**(C)** (i) පහත දී ඇති පරිපථයේ සඳහන් උපාංගවල සංකේත ඇතුළත්ව පරිපථය ඇඳ දක්වන්න.




(ii) මෙම පරිපථයේ ම LED බල්බය සවි කරන විට සැලකිය යුතු ප්‍රධාන සාධකය කුමක් ද ?

....................................................................................................................

(ල. 04)

**04.** (A) කැපුම් මල් හා විසිතුරු පත්‍ර අපනයනය කිරීම ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන ප්‍රධාන ආදායම් මාර්ගයක් වේ.

(i) මල් අපනයනය කරන වගා කරුවෙකුට වගා කිරීමට සුදුසු ඇන්තුරියම් ප්‍රභේද දෙකක් සඳහන් කරන්න.

1) ........................................................................................ (ල. 04)

2) ........................................................................................ (ල. 04)

(ii) **a)** වාණිජව සිදු කරන ඇන්තුරියම් වගා කරන්නෙකුට වඩාත් සුදුසු ශාක ප්‍රචාරණ ක්‍රමය කුමක්ද?

........................................................................................ (ල. 02)

**b)** (ii) a) හි සඳහන් කළ පිළිතුරට හේතුව සඳහන් කරන්න.

........................................................................................ (ල. 04)

(iv) අපනයනය සඳහා ඇන්තුරියම් මලක තිබිය යුතු සම්මත තත්ත්ව දෙකක් සඳහන් කරන්න.

1) ........................................................................................................................

2) ........................................................................................................................ (ල. 03 × 2)

**(B)** උත්පාදනය වන ස්ථානයේ සිට බැහැර කරන ස්ථානය දක්වා සියලු ක්‍රියාකාරකම් නියාමනය හා නීති පැනවීම සහ අපද්‍රව්‍ය කළමනාකරණයයි.

(i) නිවසේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී වැඩි ප්‍රමුඛතාව දිය යුතු කාර්යය කුමක් ද ?

........................................................................................ (ල. 03)

**(ii)** නිවසේ දී පොලිතින් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අනුගමනය කළ හැකි පියවර දෙකක් සඳහන් කරන්න.

1) ........................................................................................

2) ........................................................................................ (ල. 03 × 2)

**(iii)** ආහාර කර්මාන්ත ශාලාවක පිවිතුරු නිෂ්පාදන සංකල්පය ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කළ හැකි ශිල්ප ක්‍රම තුනක් සඳහන් කරන්න.

1) ........................................................................................ (ල. 04)

2) ........................................................................................ (ල. 04)

3) ........................................................................................ (ල. 04)

**(C)** ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය කුසලතා සංවර්ධනය පුහුණු කිරීම හා දැනුම ලබා දීමෙන් වැඩි දියුණු කළ හැකි ය.

(i) ව්‍යවසායකත්ව කුසලතා හඳුනා ගැනීමේ මෙවලම් තුනක් සඳහන් කරන්න.

1) .................................................................... (ල. 04)

2) .................................................................... (ල. 04)

3) .................................................................... (ල. 04)

**(ii)** ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමට ශඳුඅත විශ්ලේෂණය භාවිත කළ හැකි ය. වර්තමාන ව්‍යවසායිකයින්ට ඇති ප්‍රධාන තර්ජන දෙකක් සඳහන් කරන්න.

1) .................................................................... (ල. 04)

2) .................................................................... (ල. 04)

**(D)** සේවකයන්ගේ ශරීරය හෝ ශරීරයේ කොටසක් ආවරණ සඳහා භාවිතා කරන උපකරණ පුද්ගල ආරක්ෂක උපකරණ වේ.

(i) පහත සඳහන් පුද්ගලයින් සේවයේ යෙදීමේ දී පැළඳිය යුතු පුද්ගල ආරක්ෂණ උපකරණ සඳහන් කරන්න.

| **පුද්ගලයා** | **උපකරණය** | |
|---|---|---|
| 1) උක් කපන්නා | .................................................... | (ල. 02) |
| 2) වෛද්‍යවරයා | .................................................... | (ල. 02) |
| 3) සිවිල් ඉංජිනේරුවා | .................................................... | (ල. 02) |
| 4) සිමෙන්ති කර්මාන්ත ශාලා කම්කරුවා | .................................................... | (ල. 02) |

අ.පො.ස. උසස් පෙළ

# ජෛවපද්ධති තාක්ෂණවේදය i

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

**විභාග අංකය:** ........................................

- **අංක 1- 50 දක්වා බහුවරණ ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.**

**01.** ජෛවපද්ධති මත ඇතැම් කාලගුණික පරාමිති ඇති කරන බලපෑම් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

**A** - වළාකුළු ආවරණය වැඩි වීම බෝගවල ඵලදාව අඩු වීමට හේතු වේ.
**B** - වායුගෝලීය පීඩනය වැඩිවීම ගංවතුර ඇති වීමට හේතු වේ.
**C** - ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම කොරල් බුහුබාවන්ගේ වර්ධනය සීමා කිරීමට හේතු වේ.
ඉහත ප්‍රකාශ අතුරින් **නිවැරදි** වන්නේ,

1. A පමණි. 2. B පමණි. 3. A සහ B පමණි.
4. A සහ C පමණි. 5. A, B සහ C යන සියල්ල ම (................)

**02.** පාංශු වයනය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.

**A** - මැටිමය පසෙහි ජලය රඳවා තබා ගැනීමේ ධාරිතාව වැඩි වන අතර වැලිමය පසෙහි අඩු ය.
**B** - මැටිමය පසෙහි පෘෂ්ඨීය ක්ෂේත්‍රඵලය වැඩි ය. එමෙන් ම ක්ෂුද්‍ර අවකාශ වැඩි ය.
ඉහත ප්‍රකාශ අතරින්,

1. A සත්‍ය වේ. B අසත්‍ය වේ.
2. A අසත්‍ය වේ. B සත්‍ය වේ.
3. A හා B දෙක ම අසත්‍ය වේ.
4. A සත්‍ය වන අතර, B මගින් එය වඩාත් පැහැදිලි කරයි.
5. B සත්‍ය වන අතර, A මගින් එය වඩාත් පැහැදිලි කරයි. . (................)

**03.** පසෙහි රසායනික ලක්ෂණ තීරණයේ දී පාංශු කලිලවලට ප්‍රධාන තැනක් හිමි වේ. එයට ප්‍රධාන හේතුව වන්නේ,

1. පාංශු කලිලවල විෂ්කම්භය කුඩා වීම ය. .
2. පාංශු කලිල ජල වහනය දියුණු කිරීම ය.
3. විවිධ විෂ සහිත අයන අවශෝෂණය කිරීම ය.
4. පාංශු කලිල ශාකවලට අවශ්‍ය අත්‍යාවශ්‍ය පෝෂක සැපයීම ය.
5. කලිලවල ඇති ගුණාංග නිසා පසෙහි ඇති අයනවල හැසිරීම තීරණය කිරීම ය. (................)

**04.** පසෙහි ලවණතාව ඉවත් කිරීමට සුදුසු ක්‍රමයක් වන්නේ,

1. පස බුරුල් කර හුණු යෙදීමයි. 2. පස බුරුල් කර ඩොලමයිට් යෙදීමයි.
3. පස බුරුල් කර ජිප්සම් යෙදීමයි. 4. පස තද කර කාබනික පොහොර යෙදීමයි.
5. පස ජලයෙන් පුරවා ගැඹුරු වැස්සීමකට ලක් කිරීමයි. . (................)

**05.** සිතියමක පරිමාණය 1 : 50 000 ලෙස දක්වා තිබුණි. එම සිතියමෙහි නගර දෙකක් අතර දුර 8.50 cm නම් ඒ අනුව මෙම නගර දෙක අතර සැබෑ දුර කුමක් ද ?

1. 4. 25 km
2. 4.5 km
3. 850 km
4. 5 km
5. 7.50 km (................)

**06.** මට්ටම් ගැනීමේ දී යොදා ගන්නා පසු දැක්ම යනු,

1. උච්චත්වය නොදන්නා ලක්ෂ්‍යයක ගන්නා පාඨාංකයයි.
2. මට්ටම් ගැනීමේ දී සෑම විට ම දෙවනුව ගන්නා පාඨාංකයයි.
3. උච්චත්වය දන්නා ලක්ෂ්‍යයක ගන්නා පාඨාංකයයි.
4. පෙර දැක්ම නිරවද්‍යතාවක් අවශ්‍ය නොවන පාඨාංකයයි.
5. අතරමැදි දැක්මක් ලබා ගැනීමේ දී ගනු ලබන පාඨාංකයයි. (................)

**07.** බිම් මැනීමේ දී තියෝඩලයිට්ටුව යොදාගෙන මනිනු ලබන්නේ,

1. සිරස් කෝණ වේ.
2. සිරස් උස වේ.
3. තිරස් දිග වේ.
4. සිරස් හා තිරස් දිග වේ.
5. සිරස් හා තිරස් කෝණ වේ. (................)

**08.** සමෝච්ච රේඛා ඇඳීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

**A** - ඒකාකාරී පළලක් තිබීම.

**B** - තියුණු හැරවුම් භාවිත නොකිරීම.

**C** - රේඛා සනකම්ව තිබීම.

ඉහත ප්‍රකාශ අතුරින් **වඩාත් නිවැරදි** වනුයේ,

1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A සහ B පමණි.
5. B සහ C පමණි. (................)

**09.** විංක්ලර් ක්‍රමය මගින් නිර්ණය කරන්නේ ජලයෙහි,

1. ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම ය.
2. ද්‍රාවීය ඔක්සිජන් ප්‍රමාණ ය.
3. රසායනික ඔක්සිජන් ඉල්ලුම ය.
4. තැන්පත් වන ඝන ද්‍රව්‍ය ප්‍රමාණය ය.
5. කඨිනත්වය ය. (................)

**10.** අපජල පිරිපහදුවේ මූලික පිරියම් කිරීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. නිර්වායු බැක්ටීරියා යොදා ගැනීමක් සිදු කරයි.
2. නිර්වායු මෙන් ම ස්වායු බැක්ටීරියා යොදා ගැනීම මගින් සිදු කරයි.
3. පිරිපහදුවට ජලය ඇතුල් කිරීමට පෙර සිදු කරයි.
4. ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීමක් සිදු කරයි.
5. ජලයේ ඇති කාබනික ද්‍රව්‍ය ඉවත් කිරීමක් සිදු කරයි. (................)

- **ප්‍රශ්න අංක 11ට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන යොදා ගන්න.**




**11.** ඉහත රූපසටහනෙහි දක්වා ඇති අතු බැදීම,

1. සරල අතු බැදීමකි. 2. වායව අතු බැදීමකි. 3. සංයුක්ත අතු බැදීමකි.
4. අග්‍රස්ථ අතු බැදීමකි. 5. අඛණ්ඩ අතු බැදීමකි. (..............)

**12.** යුගල් ලෙස අභිජනනය කරනු ලබන විසිතුරු මත්ස්‍යයන් පමණක් දක්වෙන වරණය තෝරන්න.

1. ගප්පි, ගුරාමි, එන්ජල්, ගෝල්ඩ්ෆිෂ් 2. ඩිස්කස්, ගුරාමි, එන්ජල්, ටෙට්රා
3. ගප්පි, කාප්, එන්ජල්, ගෝල්ඩ්ෆිෂ් 4. ප්ලේටි, කාප්, ගප්පි, ගෝල්ඩ්ෆිෂ්
5. ප්ලේටි, ගුරාමි, ගප්පි, ගෝල්ඩ්ෆිෂ් (................)

**13.** ශ්‍රී ලංකාවේ ආහාරමය මත්ස්‍ය වගාව පිළිබඳව පහත ප්‍රකාශ සලකා බලන්න.

**A** - මිරිදිය ජලාශවල දේශීය මත්ස්‍යයන් ප්‍රධාන ලෙස වගාව කරයි.
**B** - යාපනය ප්‍රදේශයේ කරදිය ජල ප්‍රභව ආශ්‍රිතව මුහුදු කැකිරි ප්‍රධාන වශයෙන් වගා කරයි.
**C** - වේක්කයා, මොදා කිවුල් දියෙහි වගා කරයි.

ඉහත වගන්ති අතුරින් **වඩාත් නිවැරදි වනුයේ,**

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. A සහ C පමණි. 5. A, B සහ C පමණි. (................)

**14.** බ්‍රොයිලර් මස් නිෂ්පාදනයේ උණු ජලය ගිල්වීමේ ප්‍රධාන (scalding) අරමුණ වන්නේ,

1. අතුණුබහන් ඉවත් කිරීම පහසු කිරීම වේ. 2. පිහාටු ඉවත් කිරීම පහසු කිරීම වේ .
3. ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීම වේ . 4. සම ඉවත් කිරීම පහසු කිරීම වේ .
5. මාංසය රසවත් කිරීම වේ . (................)

**15.**



A B C D

පරිසර උෂ්ණත්වය අනුව බෘඩරයක කුකුළු පැටවුන්ගේ හැසිරීම ඉහත සඳහන් රූපසටහන් මඟින් නිරූපණය කරයි. ඉහත රූපසටහන අනුව වඩා යෝග්‍ය උෂ්ණත්වයක් පවතිනුයේ කුමන බෘඩරයේ ද ? බෘඩරවල ද ?

1. A පමණි. 2. B පමණි. 3. C හා B පමණි.
4. A සහ D පමණි. 5. A, C හා D පමණි. (................)

**16.** ආහාර සිසිල් ජීවානුහරණයට උදාහරණයක් වන්නේ,

1. දුම් ගැසීම ය. 2. සරු කිරීම ය. 3. අසූත විජලනය ය.
4. ප්‍රවිකිරණය ය. 5. අධිපීඩන සැකසීම ය. (................)

**17.** කිරි ගුණාත්මක හා ප්‍රමාණාත්මක පරීක්ෂා පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

**A** - බුරුළු ප්‍රදාහයට ලක්ව ඇති දෙනකුගේ කිරි COB පරීක්ෂණයෙන් හඳුනාගත හැකි ය.
**B** - සීනි අපමිශ්‍රණය වූ කිරිවලට ග්ලිසරින් එකතු වූ විට රතු පැහැ වේ.
**C** - කිරිවල වර්ධනය වන ආම්ලිකතාව අනුමාපනයෙන් හඳුනාගත හැකි ය.

ඉහත වගන්ති අතුරින් **වඩාත් නිවැරදි වනුයේ,**

1. A පමණි. 2. B පමණි. 3. A හා B පමණි.
4. B සහ C පමණි. 5. A, B සහ C සියල්ල ම (................)

**18.** ජෛව රසායනික පරිරක්ෂණය කිරීම පිළිබඳ නිවැරදි වගන්තිය තෝරන්න.

1. ආහාරවල ජල සක්‍රියතාව අඩු කරයි. 2. පරිරක්ෂක ක්ෂුද්‍රජීවී ක්‍රියා පාලනය කරයි.
3. ක්ෂුද්‍රජීවීන් යොදා ගනිමින් පරිරක්ෂණය කරයි. 4. එන්සයිම ක්‍රියා පාලනය කරයි.
5. ප්‍රතිඔක්සිකාරක මඟින් ඔක්සිකරණ ක්‍රියාවලිය පාලනය කරයි. (................)

**19.** තත්ත්ව කළමනාකරණ පද්ධතියක් වන GHP වඩාත් පැහැදිලි කරන්නේ,

1. නිෂ්පාදනය තුළ යෙදෙන සේවක ස්වස්ථතාව පිළිබඳවයි.
2. යන්ත්‍ර සූත්‍ර නිසි පරිදි නඩත්තු කිරීම පිළිබඳවයි.
3. බෝග සනීපාරක්ෂාව සිදු කිරීම පිළිබඳවයි.
4. පරිසරයේ සෞඛ්‍යාරක්ෂිතභාවය පිළිබඳවයි.
5. නිෂ්පාදනයේ එක් එක් පියවර පාලන කිරීම පිළිබඳවයි. (................)

**20.** කම්කරුවෙකුගේ දෛනික වැටුප රු. 1600.00කි. බිස්කට් 100ක් නිෂ්පාදනය සඳහා මිනිත්තු 150ක් වැය වේ නම් බිස්කට් නිෂ්පාදනය සඳහා ශ්‍රම පිරිවැය වන්නේ,

1. රු. 400. 00 කි. 2. රු. 500. 00 කි. 3. රු. 1600 . 00 කි.
4. රු. 650. 00 කි. 5. රු. 850. 00 කි. (................)

**21.** කරවිල සුබීකරණයේ දී මැග්නීසියම් ඔක්සයිඩ් භාවිත කරන්නේ,

1. වර්ණය පවත්වා ගැනීමට ය. 2. ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීමට ය.
3. ආහාරයේ වාතය ඉවත් කිරීමට ය. 4. වියළීම පහසු කිරීමට ය.
5. ආහාරයේ තිත්ත රස ඉවත් කිරීමට ය. (................)

**22.** ආහාරයක අඩංගු සංයෝග අන්තර් ක්‍රියා කිරීමෙන් සිදුවන වර්ණ වෙනස් වීම හඳුනාගත හැකි ඇසුරුම් පද්ධතිය වන්නේ,

1. ජෛව හායනයකට ලක්වන ඇසුරුම්කරණ පද්ධතියයි.
2. නවීකෘත අභ්‍යන්තර ඇසුරුම්කරණ පද්ධතියයි.
3. පාලිත තත්ත්ව යටතේ ඇසුරුම්කරණ පද්ධතියයි.
4. බුද්ධිමත් ඇසුරුම්කරණ පද්ධතියයි.
5. රික්තක ඇසුරුම්කරණ පද්ධතියයි. (................)

**23.** පිරුණු ඇට සහිත සහල් අස්වැන්නේ ප්‍රතිශතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - පසු අස්වනු ක්‍රියාකාරකම් මත රඳා පවතී.
B - දියුණු රටවල වීවල මිල තීරණයට යොදා ගනී.
C - වී පොත්ත හා නිවුඩ්ඩ පියවර දෙකක දී ඉවත් කිරීමෙන් HRY ප්‍රතිශතය අඩු වේ.

ඉහත වගන්ති අතුරින් **වඩාත් නිවැරදි වනුයේ,**

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. A සහ B පමණි. 5. A, B සහ C සියල්ල ම (................)

**24.** නිර්පාංශු වගා ක්‍රම පිළිබඳව වගන්ති කිහිපයක් පහත දැක්වේ.

A - DFT ක්‍රමයේ දී 100 cm විෂ්කම්භයකින් යුත් PVC නළ යොදා ගනී.

B - තිරස් වගා මලු සඳහා විසිරුම් මගින් ජල සම්පාදනය බහුලව යොදා ගනී.

C - සිරස් වගා මලු සඳහා කොහු කෙඳි උචිත වන්නේ ඒවා සැහැල්ලු බැවිනි.

ඉහත වගන්ති අතුරින් **වඩාත් නිවැරදි වනුයේ,**

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. B සහ C පමණි. 5. A සහ C පමණි. (................)

**25.** මෙම රූපයේ දැක්වෙන්නේ පෙට්‍රල් එන්ජිමක ඉන්ධන පද්ධතියේ උපාංගයකි. මෙම උපාංගයේ ප්‍රධාන කාර්යය වන්නේ,



1. කපාට විවෘත කිරීම හා වැසීම ය.
2. පෙට්‍රල් දහනයට විදුලි පුළිඟුවක් ලබා දීම ය.
3. අධික පීඩනයකින් ඩීසල් සිලින්ඩරය වෙත යැවීම ය.
4. අලුතින් වාතය සිලින්ඩරය තුළට ලබා ගැනීම ය.
5. සිලින්ඩරයේ දැවුණු වාතය පිට කිරීම ය. (................)

**26.** වාහනයක ඉන්ධන පද්ධතියක කාබියුරේටරයේ කාර්යය වන්නේ,

1. එන්ජිම දක්වා ගමන් කරන ඉන්ධන මිශ්‍රණය වේගයෙන් සිලින්ඩරය තුළට මුදා හැරීමයි.
2. ඉන්ධන දහනයේ දී ඉන්ධන වායු මිශ්‍රණය නිසි අනුපාතයට සැකසීමයි.
3. ඉන්ධන දහනයේ දී පිටවන වායුව බාහිර වායුගෝලයට මුදා හැරීමයි.
4. ඉන්ධන ටැංකියේ සිට ගමන් කරන ඉන්ධන පීඩනයට ලක් කිරීමයි.
5. ඉන්ධන ටැංකියේ සිට ගමන් කරන ඉන්ධන පෙරීමකට ලක් කිරීමයි. (................)

**27.** ගොවි මහතෙකු ජලය පොම්ප කිරීම සඳහා පොම්පය ක්‍රියාත්මක කළ විට පොම්පය ක්‍රියාත්මක වුව ද ජලය පොම්ප නොවේ නම් එයට හේතුව,

1. පොම්පයේ ආරක්ෂිත ස්විච්චය ක්‍රියා විරහිත වීම ය.
2. පාද කපාටය තෙක් ජල ප්‍රභවයේ ජලය නොමැති වීම ය.
3. පොම්පය සවි කිරීමේ දී විසර්ජක හිස විශාල වීම ය.
4. පොම්පය සවි කිරීමේ දී නැමි හා සම්බන්ධ කිරීම් වැඩි වීම ය.
5. විශාල ධාරිතාවක ජලය පොම්ප කිරීම ය. (................)

**28.** ගොවියෙකුගේ වගා ළිඳේ ජල මට්ටමට පහළින් ජල පොම්පය සවි කර ඇත. මුළු විසර්ජන හිස 15 m නම් ද, ජල මට්ටමේ සිට පොම්පයේ චූෂණ විවරයේ මධ්‍ය ලක්ෂ්‍යයට උස 6 m නම් මෙහි මුළු හිස ගණනය කරන්න.

1. 14 m 2. 21 m 3. 14 m 4. 9 m 5. 18 m (................)

**29.** ද්වි රෝද ට්‍රැක්ටරයෙන් ක්‍රියා කරවිය හැකි බිම් සැකසීමේ උපකරණ වන්නේ,

1. හැඩ ලැලි නගුල, රොටවේටරය හා කොකු නගුල වේ.
2. තැටි පෝරුව, හැඩ ලැලි නගුල හා මට්ටම් ලෑල්ල වේ.
3. තැටි පෝරුව, තැටි නගුල හා සැහැල්ලු යකඩ නගුල ය.
4. රොටවේටරය, රිජරය හා හැඩලැලි නගුල වේ.
5. මට්ටම් ලෑල්ල, තැටි පෝරුව හා කොකු නගුල වේ. (................)

**30.** ද්‍රවවල විරූපන ප්‍රබලතාව යනු,

1. ද්‍රව කැබැල්ල කොටස් දෙකක් අතරින් ලිස්සා යෑමට එරෙහිව දක්වන ප්‍රතිරෝධයයි.
2. ද්‍රව කැබැල්ල ඇදීමට එරෙහිව දක්වන ප්‍රතිරෝධයයි.
3. ද්‍රව කැබැල්ල පොඩි වීමට දක්වන ප්‍රතිරෝධයයි.
4. ද්‍රව කැබැල්ලකට දෙපසට විරුද්ධව බලයක් යෙදූ විට ලිස්සා යාමට දක්වන ප්‍රතිරෝධයයි.
5. ද්‍රව කැබැල්ලක් දෙපසින් ඇඹරී යාමට එරෙහිව දක්වන ප්‍රතිරෝධයයි. (................)

**31.** පයිනස් රෙසිනය රැස් කිරීමට කඳෙහි V හැඩැති කැපුම යෙදිය යුත්තේ,

1. පොළොව මට්ටමේ සිට 120 cmක් පමණ ඉහළිණි.
2. පොළොව මට්ටමේ සිට 60 - 90 cmක් පමණ ඉහළිණි.
3. පොළොව මට්ටමේ සිට 25 - 50 cmක් පමණ ඉහළිනි.
4. 30° ආනතියකින් ප්ලෝයම පටකය දක්වා ය.
5. 120° ආනතියකින් ප්ලෝයම පටකය දක්වා ය. (................)

**32.** වෘත්තීය අනතුරු වළකාලීම සම්බන්ධයෙන්, සේවකයා මෙන් ම සේවා යෝජකයා ද සතු වගකීම් ඇත. මින් සේවකයා සතු වගකීම වන්නේ.

1. සේවක ආරක්‍ෂාව සම්බන්ධයෙන් දී ඇති උපදෙස් පිළිපැදීමයි.
2. ප්‍රමිතියකින් යුත් පුද්ගල ආරක්‍ෂක උපකරණ සැපයිමයි.
3. වෘත්තීය පිළිබඳ ඉතා හොඳ පුහුණුවක් ලබා දීමයි.
4. අවධානමක් ඇති වැඩවලින් මගහැර සිටීමයි.
5. රක්ෂණ ආවරණයක් ලබා ගැනීමයි. (................)

**33.** පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව වගන්ති තුනක් පහත දැක්වේ.

**A -** දිසිදි පොල් නිෂ්පාදනයේ දී පොල් කුරුට්ට ඉවත් කළ යුතු ය.
**B -** වියළි ක්‍රමය යටතේ කොප්පරාවලින් පොල් තෙල් නිෂ්පාදනයේ දී ඒවායේ තෙතමනය 6% ට වඩා අඩු විය යුතු ය.
**C -** තෙත් ක්‍රමයට පොල්තෙල් නිස්සාරණයේ දී වැඩි පොල්තෙල් ප්‍රමාණයක් නිපදවා ගත හැකි ය.

ඉහත මෙම වගන්ති අතරින් නිවැරදි වන්නේ,

1. B පමණි.
2. A සහ B පමණි.
3. A සහ C පමණි.
4. B සහ C පමණි.
5. A, B සහ C සියල්ලම ය. (................)

**34.** නව ආහාර නිෂ්පාදනය පිළිබඳ නිවැරදි වගන්තිය තෝරන්න,

1. ආහාරයට වැඩිපුර සීනි හා මේදය එකතු කිරීමෙන් බෝ නොවන රෝග ඇති වේ.
2. ආහාරයට වැඩිපුර සීනි හා මේදය එකතු කිරීම සෞඛ්‍යයට හිතකර ය.
3. කුඩා ළමුන්ගේ ආහාරවලට බොහෝ වර්ණක එකතු කරයි
4. නව ආහාර නිපදවීමේ රටාව බෝ වන රෝග වළක්වාලයි.
5. ආහාරවලට වැඩිපුර ආකලන එකතු කිරීමෙන් එහි ගුණාත්මය ඉහළ දමයි. (................)

**35.** ස්වයංක්‍රීය පරිපථවල භාවිත කරන LDR,

1. ආලෝකයට සංවේදී වේ.
2. උෂ්ණත්වයට සංවේදී වේ.
3. සාපේක්‍ෂ ආර්ද්‍රතාවට සංවේදී වේ.
4. pH අගයට සංවේදී වේ.
5. පාංශු උෂ්ණත්වයට සංවේදී වේ. (................)

**36.** ප්‍රත්‍යාවර්ත ධාරාවක් සරල ධාරාවක් බවට පත් කිරීම සෘජුකරණය සඳහා පරිපථයක යොදා ගන්නේ,


1


2


3


4


5

(................)

**37.** ජෛව ප්‍රතිකර්මකරණය භාවිතයක් වන්නේ,

1. නැනෝ තාක්ෂණය භාවිතයෙන් ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීමයි.
2. සූර්යය ශක්තිය භාවිත කර පරිසර පද්ධතිවල දූෂක බිඳ දැමීමයි.
3. දූෂණය වූ පරිසර පද්ධති ක්ෂුද්‍රජීවීන් භාවිත කර පිරියම් කිරීමයි.
4. අපජලය පරිපහදු ක්‍රියාවලියේ දී නිර්වායු ජීවීන් භාවිත කිරීමයි.
5. ක්ෂුද්‍රජීවීන් භාවිත කර පසේ සාරවත් බව වැඩි කිරීමයි. (................)

**38.** වාණිජ මට්ටමින් නිෂ්පාදනය කෙරෙන නිෂ්පාදන කිහිපයක් පහත දැක්වේ.

**A -** **පලතුරු යුෂ** **B -** **සක්‍රීය කාබන්** **C -** **සුවඳ විලවුන්** **D -** **බැලූන්**

ඉහත සඳහන් නිෂ්පාදන අතරින් ශාක සාර යොදා ගෙන සිදු කරනු ලබන නිෂ්පාදන වනුයේ,

1. A සහ B පමණි.
2. A සහ C පමණි.
3. A සහ D පමණි.
4. B සහ C පමණි.
5. A, B සහ C පමණි. (................)

**39.** ශ්‍රී ලංකාවේ බලශක්ති නිෂ්පාදනය සඳහා ජෛව ස්කන්ධ ලෙස වගා කිරීමට යෝජිත වූ ශාකය වන්නේ මින් කුමක් ද ?

1. පොල්
2. ග්ලිරිසීඩියා
3. උණ
4. වේවැල්
5. රබර් (................)

**40.** පහත වගන්ති සලකන්න.

**A -** පිරිසිදු ජලයේ ජල සක්‍රියතා අගය එකකි.
**B -** ආහාරයක ජල සක්‍රියතාව වියළීමෙන් පහත හෙළිය හැකි ය.
**C -** ජෑම්වල ජල සක්‍රියතාව වියළි පලතුරක ජල සක්‍රියතාවට වඩා වැඩි ය.

ඉහත ප්‍රකාශන අතරින් සත්‍ය වනුයේ,

1. A පමණි.
2. B පමණි.
3. A සහ B පමණි.
4. A සහ C පමණි.
5. A, B සහ C සියල්ල. (................)

- **ප්‍රශ්න අංක 41ට හා 42ට පිළිතුරු සැපයීම සඳහා පහත බෝග කාණ්ඩ යොදා ගන්න.**

**A -** ආලංගා (*Ipomoea bonas*), අවර (*Canavalia enisiformis*), වදුරු මෑ (*Carpogon Pruriens*)
**B -** ක්‍රොසැන්ඩා, පොලිසියාස්, ඇග්ලොනිමා
**C -** රෝමා, බියැන්ස්, තිලිණ තක්කාලි ප්‍රභේද

**41.** ආහාර බෝගවලින් නිර්මිත බෝග වගාවට වඩා උචිත බෝග කාණ්ඩය වනුයේ,

1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A සහ C පමණි.
5. A, B සහ C සියල්ල ම (................)

**42.** භූමි අලංකරණයේ දී බෝදරක් නිර්මාණයට වඩාත් උචිත ශාක කාණ්ඩය වනුයේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. A සහ C පමණි. 5. A, B සහ C සියල්ල ම (................)

**43.** ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව පානීය ජලයේ තිබිය යුතු අවම pH අගය වන්නේ,

1. 7. 0 වේ. 2. 8.0 වේ. 3. 8.5 වේ.
4. 6.5 වේ. 5. 9.0 වේ. (................)

**44.** ප්‍රවාහන ඇසුරුමක රූපයේ දැක්වෙන ලේබල් සංකේතයෙන් නිරූපණය වන්නේ කුමක් ද ?



1. ට්‍රොලියෙන් තබාගෙන යෑමෙන් වළකින්න.
2. ගොඩගැසීම සීමිත ය.
3. කොකු භාවිත නොකරන්න.
4. රෝල් කිරීමෙන් වළකින්න.
5. ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ය.

(................)

**45.** නෙළා ගත් මල්වල ආයු කාලය වැඩි කිරීමට සිදු කරන පසු අස්වනු ප්‍රතිකාර ක්‍රමයක් වන්නේ,

1. මල් හොඳින් සෝදා ගැනීම වේ.
2. නෙළාගත් මල්වලට ජලය ඉසීම වේ.
3. නටුව සහිතව මල් නෙළා ගැනීම වේ.
4. නෙළාගත් මල් පොලිතින් කවරයකට දැමීම වේ.
5. මල්, 12 - 16 ℃ ශීත කාමරයක කෙටි කාලයක් තැබීම වේ. (................)

**46.** උද්‍යාන බෝග වගාවේ දී වැටි සඳහා උපයෝගි කර ගත හැකි ශාක වර්ගයක් වන්නේ,

1. පිහිඹියා වේ 2. දුරුත්තා වේ. 3. සීනියාස් වේ.
4. ඇග්ලෝනීමා වේ. 5. කොසැන්ඩා වේ. (................)

**47.** වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ ජාත්‍යන්තර තත්ත්ව සහතිකයක් වන්නේ,

1. ISO 9001 වේ. 2. ISO 22000 වේ. 3. ISO 14000 වේ.
4. OHAS වේ. 5. ILO වේ. (................)

**48.** වෙළෙඳපොළ සමීක්ෂණයක දී ප්‍රාථමික දත්ත ලබා ගත හැකි ක්‍රමය හෝ ක්‍රම වන්නේ,

1. මහ බැංකු වාර්තා හා නිරීක්ෂණ වේ. 2. දුරකථන සංවාද හා මූල්‍ය වාර්තා වේ.
3. සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි වේ. 4. මහ බැංකු වාර්තා හා මූල්‍ය වාර්තා වේ.
5. වීඩියෝ දර්ශන හා පර්යේෂණ වාර්තා වේ. (................)

**49.** ශ්‍රී ලංකාවේ නිවෙස්වලින් ප්‍රධාන වශයෙන් බැහැර කරන අපද්‍රව්‍ය වර්ගය වන්නේ,

1. වීදුරු ය. 2. ප්ලාස්ටික් දවටන ය. 3. කාබනික ද්‍රව්‍ය ය.
4. කඩදාසි ය. 5. ලෝහ ද්‍රව්‍ය ය. (................)

**50.** භූමි අලංකරණයේ දී යොදා ගන්නා උෂ්ණ, ශීත හා ප්‍රාථමික වර්ණයන් වන්නේ පිළිවෙලින්,

1. රතු, තැඹිලි, කහ ය. 2. නිල්, රතු, තැඹිලි ය.
3. තැඹිලි, නිල්, කහ ය. 4. නිල්, කොළ, රතු ය.
5. නිල්, කහ, රතු ය. (................)

**(E)** ආහාර බෝගවලින් නිර්මිත භූමි අලංකරණය වඩාත් ප්‍රචලිත කිරීම කාලීන අවශ්‍යතාවකි.

(i) ආහාර බෝගවලින් නිර්මිත භූමි අලංකරණයේ වාසි දෙකක් සඳහන් කරන්න.

1) ........................................................................................................................ (ල. 02)

2) ........................................................................................................................ (ල. 02)

(ii) ආහාර බෝගවලින් නිර්මිත භූමි අලංකරණ සැලසුම්කරණයේ දී යොදා ගැනෙන මූලධර්ම දෙකක් සඳහන් කරන්න.

1) ..................................................................................... (ල. 04)

2) ..................................................................................... (ල. 04)

## B කොටස රචනා

- **ප්‍රශ්න 04 පමණක් පිළිතුරු සපයන්න.**

**(05)** a). ජෛව පද්ධතික බෝග වගාවට පසේ ජීවී සාධකවල වැදගත්කම පැහැදිලි කරන්න.

b). විද්‍යාගාරයේ දී සොසේජස් නිෂ්පාදනයේ පියවර විස්තර කරන්න.

c). ශ්‍රී ලංකාවේ දුව පදම් කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක විස්තර කරන්න.

**(06)** a). ශාක රිකිලි බද්ධ ක්‍රමයක් විස්තර කරන්න.

b). තැටි නගුලක කොටස් රූප සටහනක් භාවිතයෙන් විස්තර කරන්න.

c). දැව වියළීමේ සූර්ය තාප උදුනක ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.

**(07)** a). අපජලය පිරිපහදු කිරීමේ අවශ්‍යතාව සාකච්ජා කරන්න.

b). දම්වැල් බිම් මැනීමේ පියවර විස්තර කරන්න.

c). ශාක සාර නිස්සාරණය කරන ක්‍රම විස්තර කරන්න.

**(08)** a). රබර් කිරි රැස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරන්න.

b). කිරි පරීක්ෂණය කළ හැකි ක්‍රම විස්තර කරන්න.

c). මත්ස්‍ය අභිජනනාගාරයක නඩත්තු කටයුතු විස්තර කරන්න.

**(09)** a). මට්ටම් ගැනීම සඳහා ස්වයංක්‍රිය ලේවලයක් මට්ටම් කරගන්නා ආකාරය විස්තර කරන්න.

b). පාංශු ජීවීන් ආශ්‍රිත නිෂ්පාදන විස්තර කරන්න.

c). ආලෝක විමෝචක ඩයෝඩවල භාවිත විස්තර කරන්න.

**(10)** i). බිම් සැකසීම සඳහා වර්තමානයේ භාවිත කරන නගුල් වර්ග විස්තර කරන්න.

ii). දැව පදම් කිරීමේ දී ඇතිවන ප්‍රධාන දෝෂ විස්තර කරන්න.

iii). සිව්රෝද ට්‍රැක්ටරයක බලසම්ප්‍රේෂණය ගැලිම් සටහනකින් විස්තර කරන්න.